# 03

# බුදු සමයෙහි හරය වූ හේතුඵල දහම

එදා සෙනසුරාදා ය. වේලාව පෙරවරු අටට පමණ ඇත. **විචක්ෂණ** තාත්තා ද සමග පියමන් කෙළේ කෙත්යාය වෙතයි. ගොවීන් වී වපුරා දෙදිනක් ගත වී ඇත. තෙත් මඩ තට්ටුව මත විසුරුවා හරින ලද බිත්තර වී පැළ වී ගෙන එමින් තිබිණි. විචක්ෂණ මිටි නියර මත ඇණ තබා වාඩි වී ඉතා ඕනෑකමින් පැළවෙමින් තිබූ වී ඇට දෙස බලා සිටියේ ය. මොහොතක් කල්පනා කර තාත්තාගෙන් මෙසේ ඇසීය.

"කොහොම ද තාත්තෙ මේ වී ඇට පැළවෙන්නේ?"

මඳ සිනාවක් පා විචක්ෂණ දෙස මොහොතක් බලා සිටි තාත්තා දුන්නේ කෙටි පිළිතුරකි.

"වී ඇටයක් පැළවෙන්නේ පුතේ නිකම් ම නොවෙයි.
ඒකට වුවමනා හේතු යුක්ති තියෙන කොට."

ඒ පිළිතුරින් විචක්ෂණ සෑහීමට පත් වූ බවක් නොපෙනුණි. "මොනව ද තාත්තේ හේතු යුක්ති කියන්නෙ?". ඒ විචක්ෂණගේ ඊළඟ ප්‍රශ්නයයි.

"පුතා සරු පොළොව, වතුර, පොහොර වගේ කරුණු තියෙන කොට වී ඇටේ පැළවෙනවා."

"වතුර, පොහොර වගේ දේවල් නැත්නම්?"

"නැත්නම් ඉතින් වී ඇටේ පැළවෙන්නෙ නැහැ. මැරෙනවා. "

ඒ සාකච්ඡාව එතැනින් කෙළවර විය. විචක්ෂණ වැටුණේ දිග කල්පනාවකටයි. ලෝකෙ හැම දෙයක් ම එහෙම ද? හේතු සාධක ඇති විට ඇති වෙන දේවල් හේතු සාධක නැති විට නැති වෙනවා. එහෙම ද? ඒ සමග ම විචක්ෂණට දහම් පාසලේ දී ලොකු හාමුදුරුවන් ඉගැන්වූ පාඩමක් ද සිහියට නැගිණි. ඒ පාඩමේ දී ලොකු හාමුදුරුවන් කියන විට ලියා ගත් ගාථාවක් විචක්ෂණගේ සටහන් පොතේ තිබිණ. තාත්තා ද සමග කුඹුර වටා ඇවිද ගිය විචක්ෂණ ගෙට ගොඩ වූ සැණින් සටහන් පොත සොයා ගෙන කියවා බැලුවේ ය. බුද්ධ වචනය ඇසුරෙන් රහත් මෙහෙණින් වහන්සේ නමක් දේශනා කළ ඒ ගාථාවෙන් ද කෙතට හා බිත්තර වී වලට උපමා කොට හේතුඵල සම්බන්ධය පැහැදිලි කර තිබෙනු දුටු විචක්ෂණට මහත් සතුටක් ඇති විය. හෙතෙම ගාථාව ද එහි තේරුම ද හඬ නගා කියැවූයේ ය.

යථා අඤ්ඤතරං බීජං - ඛෙත්තේ වුත්තං විරූහති,

පඨවිරසං ච ආගම්ම - සිනේහං ච තදූභයං,

ඒවං ඛන්ධා ච ධාතුයො - ඡච ආයතනා ඉමෙ,

හේතුං පටිච්ච සම්භූතා - හේතුභංගා නිරුජ්ඣරේ.

(සංයුත්ත නිකායේ සේලා සූත්‍රය)

කෙතෙහි වපුළ යම්කිසි බිජුවටෙක් පොළෝරසය ද ජලය ද යන දෙක ලැබගෙන යම් සේ පැළවෙන්නේ ද, එසේ ම ස්කන්ධයෝ ද ධාතුහු ද සළායතනයෝ ද යන මොවුහු හේතුව නිසා හට ගන්නෝ ය. හේතු නැති වීමෙන් නැති වී යන්නෝ ය.



වී පැළයෙන් හේතුඵල දහම

විචක්ෂණ සිය කාමරයට වී කල්පනා කෙළේ ය. හෙටනෙ ආයෙමත් දහම් පාසල තියෙන්නෙ. ලොකු හාමුදුරුවන් කිව්වානෙ එන වතාවෙ මේ පාඩම තවත් විස්තර කරනවා කියලා.

ඉරිදට පහන් විය. විචක්ෂණ, පුංචි නංගී ද සමග වෙල්යාය මැදින් ගොස් පන්සලට ළඟා විය. දහම් පාසල ඇරඹුණේ උදෑසන ආගමික වතාවත්වලින් පසුවයි. පළමුවැනි කාල පරිච්ඡේදයට පන්තියට වැඩම කළෝ ලොකු හාමුදුරුවෝ ය. පන්තියේ සියලු දෙනා ලොකු හාමුදුරුවන් වහන්සේට නමස්කාර කළහ. උන් වහන්සේ පාඩම පටන් ගත්හ.

" දරුවනේ, අපි ගිය සුමානෙ කිව්ව නේ ද ගාථාවක්? මතක ද ඒක? හැම දෙනා ම නැගිටලා ඒ ගාථාව කියන්න බලන්න." සියල්ලෝ ම සටහන් පොත් පෙරළාගෙන ගාථාව සජ්ඣායනා කළහ.

"හොඳයි කාට ද කියන්න පුළුවන් පොත නො බලා ඔය ගාථාවෙ තේරුම?"

ලොකු හාමුදුරුවන් කියූ සැණින් විචක්ෂණ නැගී සිටියේ ය. "අවසරයි, හාමුදුරුවනේ බීජ පැළ වෙන්නෙත් මැරෙන්නෙත් හේතු සාධක තියෙනවා නම්. ඒ කියන්නෙ වතුර පොහොර වගේ දේවල් තියෙනවා නම් බීජ පැළවෙනවා. ඒ හේතු සාධක නැති වෙනකොට ඒ බීජ මැරිල යනවා."

"හරිම අගෙයි, විචක්ෂණගෙ උත්තරේ. මේ සත්‍යය ම තමයි හේතුඵල ධර්මය කියන්නෙ. බුද්ධ ධර්මය අනුව සියලු ජීවීන් වගේ ම ලෝකයත් හැදිල තියෙන්නෙ ස්කන්ධ, ධාතු, ආයතන කියල හඳුන්වන මූල සාධක එකතු වෙලා. ඒ මූල සාධක හෙවත් ශක්ති හේතු ප්‍රත්‍ය ඇති විට ඇතිවෙනවා, නැති විට නැති වෙනවා.

බුදුවරුන් ලෝකයේ උපන්නත් නූපන්නත් හැම කාලෙක ම, හැම දේසෙක ම, හැම දේක ම මේ හේතුඵල සත්‍යය දකින්න පුළුවන්.

ගෙයක් නිර්මාණය වීමට උළු, ගඩොල්, වැලි, සිමෙන්ති, ලී හා සෙවිලි ආදී මූල සාධක කිසියම් පිළිවෙළකට එකතු කළ යුතුය. එසේම කරත්තයක් සෑදීමට යකඩ, ලී, පට්ටම් හා වියගහ යනාදී දෑ එකතු විය යුතුය. එමෙන් ම බුදු හාමුදුරුවෝ උගන්වනවා සත්ත්වයා කියන්නෙත් ඔය වගේ මූල සාධකවල සංයෝගයක් කියල. ඒ මූල සාධක හේතුඵල ධර්මයට යටත්. හේතු ප්‍රත්‍ය ඇති විට ඇති වෙවී නැති විට නැති වෙවී පවතිනවා. ඒකට අපි කියන්නෙ සංසාරෙ කියලා. මේ දරුවන්ට දැන් තේරුණා නේද හේතු ඵල ධර්මය කියන්නෙ පරම සත්‍යයක් බව"

"එහෙමයි, හාමුදුරුවනේ" කියමින් නැගී සිටි **සුලෝචනාට** ප්‍රශ්නයක් මතු වී තිබුණි.

"හාමුදුරුවනේ, සමහරුන් කියනවා හැමදෙයක් ම වෙන්නෙ පෙර කළ කර්මයට අනුව කියලා. ඒක හරි ද?"

"සුලෝචනා දුවගේ ප්‍රශ්නය හරිම වැදගත්. බුද්ධ කාලේ ඔය වගේ මත තුනක් තිබුණා. මම පිළිවෙළින් කියන්නම්.

| | |
|---|---|
| එක | හැම දෙයක් ම වෙන්නෙ පෙර කර්මය අනුවමයි කියන මතය |
| දෙක | හැම දෙයක් ම වෙන්නෙ සියලු බල ඇති ඊශ්වර දෙවියන්ගේ මැවිල්ල අනුවයි කියන මතය |
| තුන | හැම දෙයක් ම වෙන්නෙ හේතුවක් ප්‍රත්‍යයක් නැතිව ඉබේටමයි කියන මතය |

අපේ බුදුරජාණන් වහන්සේ මේ මතවාද එකක්වත් පිළිගත්තේ නැහැ. අපට පැහැදිලි ව ම පෙනෙනවා හැම දෙයක් ම වෙන්නෙ හේතුවක් ඇති ව. හේතුවක් නිසාමයි ඵලයක් ඇති වෙන්නෙ. ඒක විද්‍යාත්මක ඇත්තක්. කර්මය, දුක් සැප ලැබෙන හේතු අතර එකක් පමණයි. ඒත් හැම වෙලාවෙ ම හැම දේකට ම එක ම එක හේතුව පෙර කළ කර්මය ම නො වෙයි. දුක් සැප ලැබෙන්නටත් නොයෙක් හේතු තියෙනවා.

ඊශ්වර දෙවියන් කියන්නෙ සමහර ආගම්වල පිළිගන්න සියලු බල ඇති දෙවියන්ට. දෙවියන්ගේ කැමැත්ත අනුව හැම දේ ම වෙනවා කියල බුදු දහම උගන්වල නැහැ. හේතුවක් ප්‍රත්‍යයක් නැතුව හැම දේ ම වෙනවා කියන එකත් බුදු දහම පිළිගන්නේ නැහැ. හැම දේකට ම හේතු ප්‍රත්‍ය තියෙනවා. ඒක අපට ඇස් පනා පිට ම දැකගන්න දැනගන්න පුළුවන්.

දැන් බලන්න ගස්වල ගෙඩි හැදෙන්නෙ හේතුවක් නැතිව නො වෙයිනෙ. ඒ ගෙඩි වැටෙන්නෙත් හේතු ඇතුව ම නෙ. වැස්ස වහින්නෙ හේතු නැතිව නො වෙයි නේ. වැස්ස පායන්නෙත් හේතු ඇතුව ම නෙ. මේ විදිහට ලෝකෙ හැම දෙයක් ම හේතුඵල ධර්මය අනුවයි වෙන්නෙ." ලොකු හාමුදුරුවෝ එසේ කිව්වම **ආදිත්‍ය** දකුණත ඔසවා නැගී සිට මෙහෙම ඇහුවා.

"අවසරයි, හාමුදුරුවනේ දුප්පත් වෙන්නෙත් හේතුඵල ධර්මය අනුව ම ද?"

"ඔව් දුප්පත් වීම විතරක් නො වෙයි, පොහොසත් වෙන්නෙත් හේතුඵල ධර්මය අනුව. දුප්පත්කම නිසා මිනිස්සු හොරකම් කරනවා. ඒ හොරකම් වහගන්න බොරුත්

කියනවා. ප්‍රාණඝාතයත් කරනවා. ඔය හැටියට සමාජයේ නොයෙක් වැරදි ක්‍රියා, පව්කම්, අකුසල් වැඩිවෙන්නෙත් හේතුඵල ධර්මය අනුව.''

''ලෝකෙ සමහර මිනිසුන්ගේ සිත් අපිරිසිදුයි. ඉරිසියාව, වෛරය, තණ්හාව වැඩියි. එහෙම අය ඒ නරක පාප සිතුවිලි නිසා නොයෙක් වැරදි කරනවා. එහෙම කරලා සමහරුන් දඬුවම් ලබනවා විතරක් නො වෙයි, මෙලොවත් පරලොවත් දුක් විඳිනවා. මේ දරුවන් අහල ඇති ඌරන් මරා ජීවත් වුණු චුන්දසූකරික ගැන. එයාගෙ හිත නපුරුයි. දූෂිතයි. ඒ නිසා ඒ විදිහට පව්කම් කළා. පව්කම් නිසා මෙලොවත් දුක් වින්දා, මරණින් මතු පරලොවත් දුක් වින්දා. ධම්මික උපාසකතුමා බොහොම පින් දහම් කළා. එතුමාගේ සිත හොඳයි. අකුසල් යටපත් කරගෙන කුසල් කළ එතුමා ඒ හේතුවෙන් මෙලොවත් සතුටු වුණා. පරලොවත් සතුටු වුණා. මම පව්කම් කළා කියලා පසුතැවිලි වෙන්නෙත් හේතුඵල ධර්මය අනුව. පසුතැවිල්ල තමයි ප්‍රතිඵලය. පාපය අකුසලය තමයි හේතුව. මම පින්කම් කළා කියලා සතුටු වෙන්නෙත් හේතුඵල ධර්මය අනුව. සතුට සැපත තමයි ප්‍රතිඵලය, පින කුසලය තමයි හේතුව."

"දරුවනේ මේ හේතුඵල ධර්මයට බුදු දහමෙ කියන්නෙ පටිච්චසමුප්පාදය කියල. මේ දරුවො දන්නවා බුදු හාමුදුරුවො සත්‍යාවබෝධයෙන් පස්සෙ සත් සතියක් ගත කළ බව. කියන්න පළමුවෙනි සතිය කොහෙද ගත කෙළේ කියල?"

**සමන්ති** අසුනින් නැගිට්ටා " අවසරයි හාමුදුරුවනේ පළමු සතිය බෝ මැඩ නේ ද?"

"හරි, අපි කියන්නෙ පඨමං බෝධි පල්ලංකං කියලා. බෝමැඩ වැඩ සිටිමින් බුදු හාමුදුරුවෝ කෙළේ මේ පටිච්චසමුප්පාදය හෙවත් හේතු ඵල ධර්මය මෙනෙහි කරන එක. ඒකෙන් පැහැදිලි වෙනවා බුදුරජාණන් වහන්සේ අවබෝධ කර ගත් මූලික සත්‍යය පටිච්ච සමුප්පාදය බව. ඒක සදතනික සත්‍යයක්.

''මේ දරුවෝ දන්නවනෙ සංජය පිරිවැජියා ළග ශ්‍රාවකයන් වෙලා සිටිය කෝලිත උපතිස්ස කියන පිරිවැජි දෙපළ. ඒ අය සංජය පරිබ්‍රාජකතුමා අත් හැරලා සත්‍යය සොයා ගෙන දෙමගක ගියානෙ. ඉතින් අතරමගදී උපතිස්ස පිරිවැජියාට අපේ පස්වග භික්ෂූන් වහන්සේලාට ඇතුළත් අස්සජි හාමුදුරුවෝ හමු වුණා. උපතිස්ස අස්සජි හාමුදුරුවන්ගෙන් ඇහුවා ඔබේ ගුරුවරයා කවු ද? එතුමාගේ දහම මොකක් ද? කියලා. අස්සජි හාමුදුරුවෝ දුන්න උත්තරේ මෙහෙම යි.''



පඨමං බෝධිපල්ලංකං

යේ ධම්මා හේතුප්පභවා

තේසං හේතුං තථාගතෝ ආහ,

තේසං ච යෝ නිරෝධෝ

ඒවංවාදී මහාසමණෝ.

(මහාවග්ගපාළි)

'මෙම ගාථාවෙන් කියැවෙන්නේ හේතුවකින් ඇතිවන ධර්මවල නියම හේතුවත් ඒ ධර්ම නැතිවන ආකාරයත් ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කරන බවයි'

''දරුවනේ බුද්ධ දේශනාවේ පදනම මේ හේතුඵල ධර්මය. පටිච්චසමුප්පාද ධර්මය. බුදු බණේ ම කියනවා යමකු පටිච්චසමුප්පාදය තේරුම් ගත්තා කියන්නෙ ඔහු බුද්ධ ධර්මය තේරුම් ගත්තා කියන එක බව. යමකු බුද්ධ ධර්මය තේරුම් ගන්නවා කියන්නෙ ඔහු පටිච්චසමුප්පාදය තේරුම් ගන්නවා කියන එක. සත්ත්වයාගේ පැවැත්ම මෙන් ම ලෝකයේ පැවැත්ම පැහැදිලි කරන්නෙත් ඒ අනුව. කර්මය, කර්ම කරන්නා, විපාකය මේ හැම එකක් ම පැහැදිලි කරන්නෙත් ඒ අනුව. ඒ නිසා සත් බුදුවරුන්ගේ ම දහම කියලා පටිච්චසමුප්පාදය හඳුන්වලා තියෙනවා'' යි කියමින් ලොකු හාමුදුරුවෝ පාඩම අවසන් කෙළේ සිසු දරු දැරියන් ක්‍රියාකාරකමක යොදවමිනි.

## සාරාංශය

ඕනෑ ම ඵලයක් උපදින්නේ හේතුවක් නිසා ය. ඒ හේතුව නැති වූ විට ඵලය ද නැති වී යයි. 'හේතුව ඇති විට ඵලය ඇත, හේතුව නැති විට ඵලය නැත' යන මෙම දහම අනුව බුදුරජාණන් වහන්සේ සසර දුක ඇති වෙන සැටි ද නැති වෙන සැටි ද වදාළ සේක. මේ හේතුඵල දහම හැම කලට ම, හැම තැනට ම පොදු, හැම තැන ම පැතුරුණු දහමකි. මෙම දහම බුදු දහම වේ.

## ක්‍රියාකාරකම්

01. වලාකුළු, වැස්ස, තෙතමනය, තුරුලතා යන මෙම කරුණු අතර ඇති හේතුඵල සම්බන්ධය චිත්‍රයක් මඟින් පෙන්වා දෙන්න.
02. පවිටු මිතුරු ඇසුර නිසා කෙනකු දෙලොව ම පිරිහෙන අයුරු හේතුඵල ධර්මය අනුව විස්තර කරන්න.
03. කලණ මිතුරු ඇසුර හේතු කොට ගෙන ලැබෙන යහපත් ප්‍රතිඵල සතරක් නම් කරන්න.

## පැවරුම

'සියල්ල සිදු වන්නේ හේතුඵල දහම අනුව ය' යන මැයෙන් බිත්ති පුවත්පතකට කෙටි ලිපියක් සකස් කරන්න.